10 -ශ්‍රේණිය -පුරවැසි අධ්‍යාපනය

## බහු සංස්කෘතික සමාජය

''සංස්කෘතිය'' යන්න පැහැදිලි කිරිමට දාර්ශනිකයින් හා සමාජ විද්‍යාඥයින් ඉදිරිපත් කර අති නිර්වචන.

දැනුම,ඇදහිලි,කලා,නිති රිති,සිරිත්,ඇගයිම් හා මිනිසා විසින් සමාජයේ ජීවත්වන පුද්ගලයකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු ඇබ්බැහිකම් හා හැකියාවන්.

ටී.බී.ටයිලර්

නිර්වචන

සංකේතානුසාරයෙන් සමාජීය ලෙස හිමි කොට ගන්නා වූ පාරම්පරික වශයෙන් අත්පත් කොට ගන්නා වූ සියලු චර්යා රටාවන්ට දිය හැකි සමුහික නාමය සංස්කෘතිය යි

චාර්ල්ස් ඒ. එල්වුඩ්

ඇදහිලි, චින්තන ක්‍රම, ව්‍යවහාරික කලාව ,ජිවන පිළිවෙත්, සිරිත් විරිත් හා සම්ප්‍රදායන් හා සමාජීය වශයෙන් සම්මත කර ගත් ක්‍රියා කිරීම් විධි සංකෘතිය යි.

ඊ.ටී.හීලර්

ජන සමාජයේ සියලු බලවෙග මෙහෙයවන ලක්ෂණ සංස්කෘතියට අයත්.ඉන් සමහරක් නම්.

ආගම,ඇදහිලි,භාෂාව,දැනුම,ඇඳුම් පැළඳුම්,ආහාරපාන,කලාව,නිති රිති,සිරිත් විරිත්,ආචාරධර්ම,ඇගයිම්ග,පවුල් පසුබිම,ආර්තික පසුබිම,විශ්වාස,අධ්‍යාපනය.

පුද්ගලයා ජිවත්වන සමාජය අනුව සංස්කෘතිය වෙනස් වෙ.විවිධ සමාජයන්හි ඔවුන්ට අදාල සංස්කෘතික ලක්ෂණ ඇත.

පැවරුම

1.සංස්කෘතිය යන්න පැහැදිලි කිරිම සදහා ඉදිරිපත් කර ඇති නිර්වචනයක් ලියන්න.

2.ඔබ ජිවත්වන සමාජයේ සංස්කෘතියට අයත් ලක්ෂණ 5 ක් ලියන්න.

බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ.

- විවිධ ජන වර්ග,ආගම්,විවිධ භෂා කතාකරන පුද්ගලයින් සිටීම.
- සිරාත් විරිත්,අචාර ධර්ම
- ප්‍රදේශිය වශයෙන් විවිධ විම.
- දේශ සිමාවෙන් ඉක්ම ගොස් වෙනත් ජිතීන් සමග සම්මිශ්‍ර වීම.
- ගෝලීයකරණය සන්නිවෙදනය සංචාරක ව්‍යාපාරය දියුණු වීම නිසා ලෝකය විශ්ව ගම්මානයක් බවට පත් විම.

  වර්ථමාන ලෝකයේ බොහෝ රට වල බහු සංස්කෘතික සමාජයන් හදුනා ගත හැකිය.එයට හොදම නිදසුන් ලෙස ඇමරිකාව හා ඉන්දියාව ගත හැක.ලංකාවෙ විවිධ ජන වර්ග අතර සහජීවනය පවතියි.

  උදා; සිංහල ජනතාව - බෞද්ධ/ ක්‍රිස්තියානි

  දෙමළ ජනතාව -හින්දු / බෞද්ධ / ක්‍රිස්තියානි.

| ජන වර්ගය | ජන සංඛ්‍යාව | ප්‍රතිශතය | ආගම | ජන සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| සිංහල | 15,173,820 | 74.9% | බෞද්ධ | 14,222,844 | 70.2% |
| ශ්‍රි ලංකා දෙමළ | 2,270,924 | 11.2% | හින්දු | 2,554,606 | 12.6% |
| ඉන්දියානු දෙමළ | 824,323 | 4.1% | ඉස්ලාම් | 1,976,227 | 9.7% |
| ශ්‍රි ලංකා යෝනක | 1,869,820 | 9.2% | ක්‍රිස්තියානි | 1,509,606 | 7.4% |
| වෙනත් | 106,836 | 0.5% | වෙනත් | 9440 | 0.% |

( 2012-ජන සංගණය- ජන හා සංඛ්‍යාලෙඛන දෙපාර්තමේන්තුව.)

පැවරුම

1.බහු සංස්කෘතික සමාජයේ මූලික ලක්ෂණ 1----------------2-----------------3----------------

2. ලෝකය එකම වශ්ව ගම්මානයක් බවට පත් විමට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ 1----------------2--------------3-------------------

3.ශ්‍රි ලංකාවේ වාසය කරන විවිධ ජන වර්ග හා ඔවුන් අදහන ආගම් නම් කරන්න.

4.ශ්‍රි ලංකාවෙ සිංහල ජන සංඛ්‍යා ප්‍රතිශතයත් බෞද්ධ ආගම අදහන ප්‍රතිශතයත් කොපමණද?

5.බහු සංස්කෘතික සමාජයක් පවතින රටවල් 2 ක් නම් කරන්න.

ශ්‍රී ලංකාව බහු සංස්කෘතාක සමාජයක් වීම කෙරෙහි බලපෑ සාධක.

පිහිටීම

- භූ ගෝලීය පිහිටීම.
- ඉන්දියබ් සාගරයේ මධ්‍ය ගතව පිහිටීම.
- ඉන්දියාවට ආසන්නව පිහිටීම.

පෙර අපරදිග වෙළ්ද මධ්‍යස්ථානයක් ලෙස පිහිටුවීම

ආක්‍රමණ

- සේන ගුත්තික ආක්‍රමණ
- පණ්ඩු පාරින්ද ඇතුලු පිරිසගේ ආක්‍රමණ
- කාලිංස මාඝ ගේ ආක්‍රමණ
- බටහිර යුරෝපා ජාතීන්ගේ පැමිණීම.

සංක්‍රමණ

- විජය ඇතුලු පිරිසගේ පැමිණීම.
- පඩුවස්දෙව් ඇතුලු පිරිසගේ පැමිණීම
- භද්දකච්චායනා ඇතුලු පිරිසගේ පැමිණීම
- මිහිදු මහ රහතන් වහන්සේගේ පැමිණීම.
- සංඝමිත්තා තෙරණිය ඇතුලු පිරිසගේ පැමිණීම

විවිධ ජාතීන් වෙළදාද සදහා පැමිණීමත.

- අරාබි ජාතිකයින්
- ඉන්දිය ජාතිකයින්
- චීන ජාතිකයින්
- යුරෝපා ජාතිකයින්

ශ්‍රමිකින් ගෙන්වා ගැනිම.

දකුණු ඉන්දියානු ද්‍රවිඩයින්ගෙන්වා ගැනිම.

පැවරුම්

1. ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සමාජයක් බිහිවීමට ''පිහිටීම'' බලපෑ ආකාර 2 ක් ලියන්න.
2. සංක්‍රමණ යනු කුමක්ද ? ලංකාවට පැමිණි සංක්‍රමණ කන්ඩායම් 3 ක් ලියන්න.
3. ආක්‍රමණ යනු කුමක්ද ? ආක්‍රමණ වලට උදාහරණ 3 ක් ලියන්න.
4. බ්‍රිතාන්‍ය ජාතිකයින් වතු ශ්‍රමිකයින් ගෙන්වූයේ කුමන රටින්ද ?

<u>බහු සංස්කෘතික ජන සමාජයේ පැවැත්ම සඳහා යහපාලනයේ අවශ්‍යතාව.</u>

<u>යහ පාලනය යනු</u>

ආර්ථික සම්පත් හා මානව සම්පත් හිග නැති වුවත් සමහර රටවල් ආර්ථික සංවර්ධනය මන්දගාමී වීම හා සමාජ සධාරණත්වයක් ඇති නොවිම යන ප්‍රශ්නයට හේතු සාකච්ඡා කරීමෙදි පැන නගාන සංකල්පයකි යහ පාලනය.

මෙයට බලපෑ හේතුන්

- අනවශ්‍ය ආකාරයේ බලය විමධ්‍යගත වීම.
- රාජ්‍ය පාලනයේ අකාර්යශම බව.
- රාජ්‍ය සේවය දේශපාලනිකරණය විම.
- නිලධාරී වාදය.
- අල්ලස් හා දූෂණ ඉහල යාම.
- පාලකයින් වගකීමෙන් තොර වීම.
- පෞද්ගලික අංශ ජාතික අභිලාෂ නොසලකා හැරීම.

<u>බෙහෝ රටවල් මුහුණ දී ඇති ඉහත සඳහන් දුර්වලතා වලින් මිදීමට යහ පාලන සංකල්පය ඉදිරිපත් කරයි.</u>

යහ පාලනයේ ගුණාංග

දූෂණයෙන් හා වංචාවෙන් තොර පාලනය.

නිදහස හා සාධාරණත්වය තහවුරු වීම.

නීතියේ අධිපත්‍යයට ගරු කරීම හා අධිකරණයේ ස්වාධිනත්වය ආරක්ෂා කිරිම.

රාජ්‍ය පාලන බලතල ක්‍රියාවට නන්වන නිලධාරින් ජනතාවට වගකීමට බැදී සිටීම.

අයිතිවාසිකම් සුරැකීම විනිවිද භාවය.

ඇගයීම්

1. යහපාලනය යනු කුමක්ද ?
2. යහපාලනය අවශ්‍ය වීමට බලපෑ හේතුන් 3ක් ලියන්න.
3. යහපාලනයේ ගුණාංග 3 ක් ලියන්න.

යහපාලනය සඳහා එකිනෙකාගේ දේශපාලන අනන්‍යතාවයන්ට ගරු කිරීමෙ වැදගත්කම

- තමන් කැමති දේශපාලන මතවාදයක් දැරීම.
- දේශපාලන නායකත්වයට ගරු කිරීම.
- නිදහස් හා සාධාරන මැතිවරන පැවැත්වීම.

යහපාලනය සඳහා එකිනෙකාගේ ආර්ථික අනන්‍යතාවයන්ට ගරු කිරීමෙ වැදගත්කම

- තමන් කැමති නිත්‍යානුකූල වෘර්තියක නියලීම.
- වෘර්තිය සමිති පිහිටවීම.
- අදායම් බෙදී යාමෙ විෂමතාවය අවම කිරීම.

යහපාලනය සඳහා එකිනෙකාගේ සමාජ හා සංස්කෘතිය අනන්‍යතාවයන්ට ගරු කිරීමෙ වැදගත්කම

- කැමති අගමක් ඇදහීම.
- විවිධ උත්සව පැවැත් වීම.
- කැමති ප්‍රදේශයක වාසය කිරීම.

මෙම ඉහත කරුනු බහුසංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා අතවශය වේ.

බහුසංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන වාසි

- විවිධ ජන වර්ග අතර විශ්වාසභපය තහවුරු වේ
- එකිනෙකාට ගරු කිරීමට හුරු වෙ
- සහජීවනය අගය කරයි.
- නීතියට ගරු කරයි.
- විනිවිධ භාවයෙන් කටයුතු කරයි.

පැවරුම්

1.රටක යහපාලනයේ දී ජනතාවට තිබිය යුතු පහත අයිතිවාසිකම්2 බැගින් ලියන්න.

.

දේශපාලන අයිතිවාසිකම් 1 .--------------, 2 ----------------------
ආර්ථික අයිතිවාසිකම් 1--------------, 2. --------------------
සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් 1---------------, 2-----------------

2.බහු සංස්කෘතික ජන සමාජයක් තුල යහපාලනයෙන් අත්වන වාසි 3 ක් ලියන්න

බහු සංස්කෘතික ජන සමාජයක් තුල යහ පැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග.

- එකිනෙක සංස්කෘතීන් හඳුනාගෙන ගරු කිරීම.
- ගැටුම් ඇති නොවන සේ කටයුතු කිරීම.
- සමූහික බව.
- අන් මත ඉවසීම හා ගරු කිරීම.
- වෙනත් ජන වර්ගල භාෂා ඉගෙනීම හා භාවිතය.
- සමානාත්මතාවය.
- සර්ව ආගමික වැඩසටහන් ක්‍රියිත්මක කිරීම.

බහු සංස්කෘතික ජන සමාජයක ජනතාව එක්සත් වීමේ ඇති වැදගත්කම.

- එක් ජාතියක් එක් රටක් යන හැගීම වර්ධනය වීම.
- නිදහස හා ප්‍රජාත්‍රන්ත්‍රවාදය සුරැකිම.
- රටේ සංවර්ධනය වෙනුවෙන් කැපවීම.

  අන්‍ය ආගම්වලට ගරු

- අන්‍ය ආගම්වලට ගරු කිරීම.

පැවරුම්

1. ශ්‍රී ලංකාවේ විවිධ ජන වර්ග හා විනිධ සංස්කෘතින්ට අයත් මිනිසුන් ජීවත් වුවත් සියලු දෙනා----------------------- ලෙස හඳුන්වයි.
2. වෙනස්කම් තුලින් එක්සත් විම අත්කර ගත් සංවර්ධිත රටවල් දෙකකට උදාහරන දක්වන්න.
   1.-----------------, 2.------------------
3. බහු සංස්කෘතික ජන සමාජයේ යහපැවැත්ම සඳහි පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් ලියන්න.
4. ජන සමාජයක ජනතාව එක්සත් වීමේ ප්‍රයෝජන දෙකක් ලියන්න.

බහු සංස්කෘතික ජන සමාජයක ජනතාව එක්සත් වීමේ ඇති වැදගත්කම.

- එක් ජාතියක් එක් රටක් යන හැගීම වර්ධනය වීම.
- නිදහස හා ප්‍රජාතන්ත්‍රවාදය සුරැකීම.
- රටේ සංවර්ධනය වෙනුවෙන් කැපවීම.
- අන්‍ය ආගම්වලට ගරු කිරීම.

පැවරුම්

1. ශ්‍රී ලංකාවේ විවිධ ජන වර්ග හා විනිධ සංස්කෘතින්ට අයත් මිනිසුන් ජීවත් වුවත් සියලු දෙනා------------------ ලෙස හදුන්වයි.

2. වෙනස්කම් තුලින් එක්සත් විම අත්කර ගත් සංවර්ධිත රටවල් දෙකකට උදාහරන දක්වන්න.

   (1).----------------- ,( 2.)------------------

3. බහු සංස්කෘතික ජන සමාජයේ යහපැවැත්ම සදහි පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග දෙකක් ලියන්න.

4 . ජන සමාජයක ජනතාව එක්සත් වීමේ ප්‍රයෝජන දෙකක් ලියන්න.